# ගිණුම්කරණය

**බැංකු සැසඳුම් විස්තරය**

බැංකුවක ජංගම ගිණුමක් ඇති පුද්ගලයෙකුට තම ගිණුම පිළිබඳ විස්තර දක්වමින් මාසයකට වරක් එවන ප්‍රකාශනය බැංකු සැසඳුම් විස්තරයයි.

**බැංක ප්‍රකාශනයකින් අනාවරණයවන තොරතුරු**

කාලසීමාව ආරම්භයේ දි බැංකු ජංගම ගිණුමේ පැවති ශේෂය
කාලසීමාව තුළදි ගිණුමට හර කර ඇති අයිතම හා බැර කර ඇති අයිතම
කාලසීමාව අවසන් වන දිනට බැංකු ගිණුමේ ශේෂය

**මුදල් පොතේ බැංකු තීරුවේ හර ශේෂයක් ඇත්නම්**
එයින් අදහස් වන්නේ ව්‍යාපාරයට හිමි මුදලක් බැංකු ජංගම ගිණුමේ ඉතිරිව ඇති බවයි.

**මුදල් පොතේ බැංකු තීරුවේ බැර ශේෂයක් ඇත්නම්**
එයින් අදහස් වන්නේ ඒ ප්‍රමාණයට ව්‍යාපාරය බැංකුවට ණය වි ඇති බවයි. (බැංකු අයිරාව)

**ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු තීරුවේ සටහන් තැබිමට යොදා ගන්නා ද්විත්ව සටහන් මූලධර්මය වන්නේ වත්කම් පිළිබඳ ද්විත්ව සටහන් මූලධර්මයයි.**

**බැංකුව තම ගණුදෙනුකරු වෙනුවෙන් බැංකුවේ ගිණුම් පොත්වල සටහන් තැබිමට යොදා ගන්නා ද්විත්ව සටහන් මූලධර්මය වන්නේ වගකීම් පිළිබඳ ද්විත්ව සටහන් මූලධර්මයයි.**

**බැංකු ගිණුම් ප්‍රකාශය අනුව ගණුදෙනුකරුගේ ගිණුමට හර කෙරෙන අයිතම**

නිකුත් කළ චෙක්පත් සඳහා ගෙවිම්
නිත්‍ය නියෝග යටතේ කළ ගෙවීම්
අය කළ බැංකු පොලි හා බැංකු ගාස්තු

**බැංකු ගිණුම් ප්‍රකාශයට අනුව ගණුදෙනුකරුගේ ගිණුමට බැර කරන අයිතම**

තැන්පත් කරන ලද ව්‍යවහාර මුදල්
නිෂ්කාශනය වු චෙක්පත්
බැංකුව වෙත කෙළින්ම ලැබෙන ප්‍රේෂණ

 © 2007-2008

**බැංකු ප්‍රකාශයේ බැර ශේෂයකින් අනාවරණය වන්නේ**
එදිනට බැංකු ජංගම ගිණුමේ ඉතිරිව ඇති මුදල් ප්‍රමාණයයි.

**බැංකු ප්‍රකාශයේ  හර ශේෂයකින් ප්‍රකාශ වන්නේ**
ඒ ප්‍රමාණයට ව්‍යාපාරය බැංකුවට ණය වී ඇති බවයි.

# මෙය බැංකු අයිරාවයි.

**බැංකු සැසඳුම යනු**

මුදල් පොතේ බැංකු තීරුවේ නිවැරදි ශේෂය බැංකු ප්‍රකාශයේ  ශේෂය සමග එකඟ නොවන්නේ  කුමක් නිසා දැයි දැන ගැනීම  සඳහා සකස් කරන ප්‍රකාශයයි.

**මුදල් පොතේ බැංකු තීරුවේ ශේෂයත් බැංකු ප්‍රකාශයේ ශේෂයත් අසමානවීමට හේතු**

1. වැරදි
2. බැංකුවේ පමණක් සටහන් වී ඇති ගණුදෙනු
3. කාල පරතරය

- **වැරදි**

ගණනය කිරීමේ දීත් ලැබීම් හා ගෙවීම් සටහන් කිරීමේ දීත් ව්‍යාපාරය අතින් හෝ බැංකුව අතින් සිදුවී ඇති වැරදියට

- **බැංකුවේ පමණක් සටහන් වී ඇති ගණුදෙනු.**

මෙම ගණුදෙනු බැංකු ප්‍රකාශය ලැබෙන තෙක් ව්‍යාපාරයට දැන ගැනීමට අවස්ථාවක් නොලැබේ.

- **කාල පරතරය**

ව්‍යාපාරයේ ගණුදෙනු  වාර්තාවීම හා ඒවා  බැංකුවේ වාර්තාවීම අතර ඇති  විය හැකි කාල සීමාවයි.

**<u>බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කිරීමේ ක්‍රියා පිළිවෙල</u>**

මුදල් පොතේ බැංකු තීරුවේ නිශ්චිත දිනකට පවත්නා ශේෂය සංශෝධනය කිරීම.
සංශෝධිත ශේෂය බැංකු ප්‍රකාශයේ ශේෂය හා අසමානවීමට තුඩුදෙන හේතු හඳුනා ගැනීම.
හඳුනා ගත් එකී තොරතුරු පදනම් කරගෙන බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම.

**මුදල් පොත සංශෝධනය කර ගන්නා ආකාරය**

බැංකුව වෙත කෙළින්ම ලැබී ඇති ප්‍රේෂණ
බැංකුව අයකර ඇති ගාස්තු හා පොළී
මුදල් පොතේ බැංකු තීරුවේ සටහන් තැබීමේදී සිදු වී ඇති වැරදි
අගරු වු චෙක්පත්

# ඉහත ගනුදෙනු ද්විත්ව සටහන් රීති වලට අනුව සටහන් කිරීමෙන් මුදල් පොත සංශෝධනය කල හැකිය.

**බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී අදාල කර ගත යුතු අයිතම**

බැංකුවේ තැන්පත් කළ නමුත් නිෂ්කාශනය වී නැති චෙක්පත්
නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත්

## <u>බැංකු සැසඳුම් ප්‍රකාශයක ආකෘතිය</u>

| | |
|---|---|
| බැංකු ප්‍රකාශය අනුව ශේෂය (බැර) | xxxxx |
| | -÷÷÷÷÷- |
| එකතු කළා: නිෂ්කාශනය නොවූ චෙකපත් | xxxxx |
| | ÷÷÷÷÷- |
| | xxxxx |
| අඩු කළා: ඉදිරිපත් නොකළ චෙක්පත් | xxxxx |
| | ÷÷÷÷÷÷÷÷÷÷- |
| මුදල් පොත අනුව සංශෝධිත ශේෂය | xxxxx |
| | ÷÷÷÷÷÷÷÷÷÷- |

Special Thanks to: R. M. A. Rathnayake
www.edulanka.com
edulanka@gmail.com